# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා විසින්
2016 මාර්තු මස 10 දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 පෙබරවාරි මස 23 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[87 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

**මිළ : රු. 21.00 යි** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

2—PL 009813—450(2016/03)

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ –

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලියාපදිංචි කිරීම සඳහා; සහ

ආ) එසේ ලියාපදිංචි වන සුදුසුකම්ලත් පුරවැසියන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා;
විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් "පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා", "පුද්ගල නාම ලේඛනය", "හඳුනාගැනීමේ පත්‍ර" සහ "ඡායාරූපයක පිටපත් තුනක් හෝ ඡායාරූපයක්" යන වචන වෙනුවට පිළිවෙලින් "පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා", "පුද්ගලයින් පිළිබඳ ජාතික නාම ලේඛනය", "ජාතික හැඳුනුම්පත්" සහ "ඡායාරූප" යන වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියට පොදු සංශෝධනයක් සිදු කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

*4 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් "Iඅ වන කොටස" ඇතුළත් කරනු ලබයි.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුම අනිවාර්යයෙන්ම ලියාපදිංචි වීම සඳහා සහ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අලුත් වයස් සීමාවක් හඳුන්වා දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් අන්තර්කාලීන වැඩපිළිවෙලක් සඳහා විධිධිධාන සැලස්වනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද හැඳුනුම්පතක් දරන්නකුට අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන කාලයක් තුළ නැවත ලියාපදිංචි වීමට අවකාශ සැළැස්වීම සඳහා වේ.

*7 වන වගන්තිය :* මේ වගන්තිය මගින් අන්තර්කාලීන වැඩපිළිවෙලක් සඳහා විධිවිධාන සැලස්වනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ සමහර තැනැත්තන් යම් අවස්ථානුගත කරුණු යටතේ හැඳුනුම්පතක් සඳහා ඉල්ලුම් නොකිරීමේ වරදින් අත්හැරීම සඳහා වේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ ශීර්ෂය සංශෝධනය කරනු ලැබේ.

*9 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අතිරේක කොමසාරිස් ජනරාල්වරයා සහ කොමසාරිස්වරුන් පත්කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*10 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 3 වන වගන්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

*11 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය බෙදාදීම සඳහා සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ කාර්යාල ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ගේ තොරතුරු ඇතුළත් දත්ත සමූහයක් ඇති කර පවත්වාගෙන යෑම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.
***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 6 අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර සංශෝධිත පරිදි නීතියේ බලපෑම වනුයේ එම තැනැත්තාට අදාළ තොරතුරු වෙනස් වීම පිළිබඳව පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ වාර්තාගත කිරීම සඳහා ලියාපදිංචි තැනැත්තකු විසින් කොමසාරිස්වරයාට දැනුම්දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ජාතික හැඳුනුම්පත් (NIC) ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ ආකාරය නිශ්චිතව දැක්වීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුශංගික වේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඉල්ලුම්පත්‍ර බැහැර කිරීමේ ක්‍රමය නියම කිරීම වේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ජාතික හැඳුනුම්පතේ ප්‍රදර්ශනය වන තොරතුරු නිශ්චිතව දැක්වීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ජාතික හැඳුනුම්පත් (NIC) නැතිවීම පිළිබඳ හැඳුනුම්පත් දරන්නා විසින් කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම නියම කිරීම වේ.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මුල් ජාතික හැඳුනුම්පතක් නැතිවූ අවස්ථාවක දී ජාතික හැඳුනුම්පතක අනුපිටපතක් ලබාගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය පිළිබඳ විධිවිධාන සැලැස්වීම වේ.

***20 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මුල් ජාතික හැඳුනුම්පතකට හානි වූ අවස්ථාවක දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***21 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ නැතිවූ ජාතික හැඳුනුම්පතක් (NIC) හමුවූ අවස්ථාවක දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***22 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකාවේ පුරවැසියකුවීම අවසන්වන යම් තැනැත්තකු විසින් ස්වකීය ජාතික හැඳුනුම්පත (NIC) වහාම කොමසාරිස් ජනරාල්වරයා වෙත භාරදීම සඳහා නියම කිරීම වේ.

***23 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 22 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම (1අ) අලුත් උපවගන්තියක් ඇතුළත් කරනු ලබන අතර එම අලුතින් ඇතුළත් කරනු ලැබූ උපවගන්තියේ නීතියේ බලපෑම වනුයේ ජාතික හැඳුනුම්පත් නීතිවිරෝධී ලෙස සන්තකයේ තබා ගැනීම හෝ භාවිතය භාවිතය සම්බන්ධයෙන් වූ දණ්ඩන පිළිබඳ විධිවිධාන සැලැස්වීම වේ.

***24 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 3 වන සහ 9 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***25 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එය පොදුවේ ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***26 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය පොදුවේ ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***27 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 අ සිට 39 ඈ දක්වා අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ-

(i) ඇතැම් අවස්ථානුගත කරුණු යටතේ නියමිත බලධරයා විසින් කොමසාරිස් ජනරාල්වරයාට තොරතුරු සැපයීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

(ii) සහතික පිටපත් නිකුත් කිරීම සඳහා සහ ඇතැම් අවස්ථාවල දී කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා සිටි විට තොරතුරු සැපයීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

(iii) ඇතැම් අවස්ථානුගත කරුණුවල දී කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු හෙළිදරව් කිරීම සඳහා විධිවිධාන සැලැසවීම වේ.

(iv) ඇතැම් අවස්ථානුගත කරුණු වල දී ලියාපදිංචි කිරීමෙන් නිදහස් කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

(v) පුද්ගලයන් පිළිබඳ ජාතික ලැයිස්තුවට අනවසර පුද්ගලයන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

(vi) නිල රහස්‍යභාවය පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***28 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එය පොදුවේ ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***29 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එය පොදුවේ ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***30 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධිත පරිදි නීතියේ බලපෑම වනුයේ මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සඳහා වැරදි හා දණ්ඩන සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***31 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 5 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***32 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 11, 13 සහ 24 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***33 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය පොදුවේ ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***34 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් අන්තර්කාලීන වැඩ පිළිවෙළක් සඳහා විධිවිධාන සළස්වන අතර එහි නීතිය බලපෑම වනුයේ අවශ්‍ය යටිතල පහසුකම් සකස් කරන තුරු ප්‍රධාන ප්‍රඥප්තියේ 6, 9, 14, 16 සහ 17 වන වගන්ති නියමිත කාලයක් සඳහා ක්‍රියාත්මකව තැබීමට විධිවිධාන සැළැස්වීම සඳහා වේ.

# පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

එල්.ඩී.—ඕ. 33/2013

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ දීර්ඝනාමය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන), 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :-

"ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ලියාපදිංචි කිරීම සඳහා ද; එසේ ලියාපදිංචි කරනු ලබන සුදුසුකම්ලත් පුරවැසියන්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහාද; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ පනතකි."

"පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා", "පුද්ගල නාම ලේඛනය","හඳුනා ගැනීමේ පත්‍ර, සහ "ඡායාරූපයක පිටපත් තුනක් හෝ ඡායාරූපයක්" යන වචන"පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා, " "පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය","ජාතික හැඳුනුම්පත්" සහ "ඡායාරූප" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක -

(අ) "පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා" යන වචන වෙනුවට "පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා" යන වචන ද;

(ආ) "පුද්ගල නාම ලේඛනය" යන වචන වෙනුවට "පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය" යන වචන ද;

(ඇ) "හඳුනා ගැනීම් පත්‍ර" යන වචන වෙනුවට "ජාතික හැඳුනුම්පත්" යන වචන ද;සහ

(ඈ) "ඡායාරූපයක පිටපත් තුනක් හෝ ඡායාරූපයක්" යන වචන වෙනුවට "ඡායාරූප" යන වචනය

ආදේශ කරනු ලැබිය යුතු ය.

2—PL 009727—475 (2016/02)

(2) යම් දැන්වීමක, නිවේදනයක, හෝ වෙනත් ලේඛනයක "පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාට", "පුද්ගල නාම ලේඛනයට,"හඳුනාගැනීම් පත්‍රවලට" සහ "ඡායාරූපයක පිටපත් තුනකට හෝ ඡායාරූපයකට" කරනු ලබන සෑම සඳහනක්ම පිළිවෙලින්, "පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාට", "පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයට", "ජාතික හැඳුනුම්පත්වලට" සහ "ඡායාරූපවලට" කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 3, 4, 5, 6, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 20, 21, 23, 24, 26, 33, 36අ, 37, 38, 39, 40, 41, 42, 43, 47, සහ 51 සහ 55 වන වගන්තිවල "කොමසාරිස්වරයා" පිළිබඳ වූ සෑම සඳහනක් ම "පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා" සඳහා වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 1අ කොටස වශයෙන් බලාත්මක විය යුතු යː- ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 1අ කොටස ඇතුළත් කිරීම.

"1 අ කොටස

මූලික කරුණු"

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේː- ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ලියාපදිංචි කිරීමට යටත් තැනැත්තා.

2. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ වයස අවුරුදු පහළොවට එළඹ ඇති හෝ එළඹෙන සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ ලියාපදිංචිවීමට යටත් විය යුතු ය.

(2) ලියාපදිංචිවීමට යටත්වන තැනැත්තෙකු නියමිත කාලය තුළ දී -

(අ) 6 වන වගන්තියේ කාර්ය සඳහා; සහ

(ආ) ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමේ කාර්ය සඳහා,

මේ පනත යටතේ එසේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.''.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ "I වන කොටස" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්, එම කොටස මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටස සංශෝධනය කිරීම.

"I ආ කොටස"

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධන කිරීම.

"(අඅ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ අතිරේක කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් හෝ එලෙස ක්‍රියාකිරීම සඳහා නමින් හෝ ධුරයෙන් යම් තැනැත්තෙක්;

(අඅඅ) කොමසාරිස්වරයකු වශයෙන් හෝ එලෙස ක්‍රියාකිරීම සඳහා නමින් හෝ ධුරයෙන් තැනැත්තකු හෝ තවත් තැනැත්තන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක්;".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) අතිරේක කොමසාරිස් ජනරාල්වරයා, යම් කොමසාරිස්වරයෙක්, යම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙක්, යම් සහකාර කොමසාරිස්වරයෙක්, යම් සහතික කිරීමේ නිලධරයෙක් සහ යම් ලියාපදිංචි කිරීමේ නිලධරයෙක් කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත් විය යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1)වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) මේ පනත මගින් හෝ එය යටතේ කොමසාරිස් ජනරාල්වරයාට පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂයෙන් අතිරේක කොමසාරිස් ජනරාල්වරයාට, යම් කොමසාරිස්වරයකුට, යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකුට, යම් සහකාර කොමසාරිස්වරයකුට, යම් දිස්ත්‍රික් ලේකම්වරයකුට, යම් ප්‍රාදේශීය ලේකම්වරයකුට හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට බලය පවරනු ලැබිය හැකිය ;

එසේ වුවද, මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන, 51 වන වගන්තිය මගින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත පවරා ඇති වැරදි සමථයකට පත්කිරීමේ බලය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "යම් දිසාපතිවරයෙකු" යන වචන වෙනුවට "යම් දිස්ත්‍රික් ලේකම්වරයකු හෝ ප්‍රාදේශීය ලේකම්වරයෙකු" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(3) කොමසාරිස් ජනරාල්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි පළාත් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමෙන් හෝ ප්‍රාදේශීය මට්ටමෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් පිහිටුවනු ලැබිය හැකි අතර එම කාර්යාලය භාරව සිටීම සඳහා නිලධරයකු පත්කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ පුද්ගලයන් ලියාපදිංචි කිරීම සහ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ ලබාදී ඇති යම් බලතල, කාර්ය, හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට හෝ කිරීමට (3) වන උපවගන්තියේ සඳහන් කාර්යාලය භාර නිලධරයාට පවරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය.

6. (1) මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමිත ආකෘතියේ වූ සහ නියමිත ආකාරයට වූ "පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය" නම් වූ දත්ත සමුදාය පිහිටුවා පවත්වාගෙන යා යුතු අතර පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙහි ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සෑම තැනැත්තකුම ලියාපදිංචි කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලේඛනයෙහි එක් එක් තැනැත්තා සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු වාර්තාගත කර තැබිය යුතු ය :-

(අ) නම;

(ආ) උපන් දිනය;

(ඇ) උපන් ස්ථානය;

(ඈ) ස්ත්‍රී පුරුෂ භාවය;

(ඉ) ලිපිනය;

(ඊ) පවුලේ විස්තර; සහ

(උ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥප්තියට 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"තොරතුරු වෙනස්වීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්විය යුතු බව.

6 අ. මේ පනත යටතේ නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතක් දරන සෑම තැනැත්තකු විසින්ම පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය යාවත්කාලීන කිරීමේ කාර්ය සඳහා නියමිත කාලය තුළ නියමිත ආකාරයට සහ නියමිත ආකෘති පත්‍රයකට අනුව ජාතික නාම ලේඛනයේ වාර්තාගත කර ඇති එම තැනැත්තාට අදාළ තොරතුරුවලට බලපාන යම් අවස්ථානුගත වෙනසක් සිදුවුවහොත් ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "කොමසාරිස්වරයා හෝ රජයේ දිසාපති" යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (ආආ) (i) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීම මගින් :-

"(i) ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් නියම කිරීම සඳහා අමාත්‍යවරයාට මෙයින් බලය පවරා ඇති එම ලියාපදිංචිය සඳහා වූ ගාස්තුව සම්බන්ධයෙන් අත්හැරීමේ සහතිකයක් මේ පනත යටතේ ඉල්ලුම්කරුට නිකුත්කර නැත්නම්, එම ගාස්තුව ගෙවන ලද බවට සාක්ෂියක් ඉදිරිපත් කළ යුතුය; නැතහොත් යම් නියමිත ගෙවීමේ ක්‍රමයක් හරහා එම මුදල් ගෙවන ලද බව තහවුරු කළ යුතුය; හෝ";

(ආ) (ඇ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) ඉල්ලුම්කරු විසින් අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් අත්සන් කළ යුතුය; සහ"

(3) එහි (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් සමග -

(අ) (i) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තකු විසින් ගනු ලබන ඉල්ලුම්කරුගේ නියම කරනු ලබන ජෛවමිතික දත්ත;

(ii) නියම කරනු ලැබිය හැකි දිග-පළල, පිරිවිතර, ප්‍රමිතිය සහ ගුණාත්මකභාවයෙන් යුත් ඉල්ලුම්කරුගේ ඡායාරූප ; සහ

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ගනු ලබන ප්‍රතිබිම්බය,

ඉදිරිපත් කළ යුතුය.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමෙන් පසු, ඉල්ලුම් පත්‍රය ඉල්ලුම්කරුට ආපසු යැවීමට හෝ නියමිත ආකාරයට ඉල්ලුම් පත්‍රය විනාශ කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"ජාතික හැඳුනුම්පත් ලියාපදිංචි තැනැත්තකුට නිකුත් කළ යුතු ය.

14. යම් තැනැත්තෙක් ලියාපදිංචි තැනැත්තකු බවට පත්වීමෙන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම තැනැත්තාට ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු ය. එම ජාතික හැඳුනුම්පත -

(අ) නියමිත ආකෘතියෙන් යුක්ත විය යුතු අතර එහි නියමිත විස්තර සහ නියමිත වලංගු කාලය සඳහන් විය යුතු ය;

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ගනු ලබන ඡායාරූප හෝ ප්‍රතිබිම්බය දැරිය යුතු ය;

(ඇ) කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන හෝ වෙනත් යන්ත්‍රයකින් හෝ වෙනත් ක්‍රමයකින් ලබාගත් අත්සනෙහි ප්‍රතිකෘතියක් දැරිය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"නියම කරනු ලැබූ විට ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු බව.

15. (1) කොමසාරිස් ජනරාල්වරයා හෝ වෙනත් යම් නියමිත නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමක් මත ජාතික හැඳුනුම්පතක් දරන්නකු විසින් එම හැඳුනුම්පත එම ඉල්ලීමේ නිශ්චිතව දක්වා ඇති වේලාවේ දී සහ ස්ථානයේ දී ඉදිරිපත් කළ යුතු අතර එය පරීක්ෂා කිරීම සඳහා ඉඩ දිය යුතුය:

එසේ වුවද, උද්දේශිත කඩකිරීම සිදුවූ අවස්ථාවේ දී ජාතික හැඳුනුම්පත නැතිවීමෙන් පසු ළඟම ඇති පොලිස් ස්ථානයට එම නැතිවීම පිළිබඳව වාර්තා කිරීමට සහ ඒ පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයාට

ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට සහ ජාතික හැඳුනුම්පතේ දෙවන පිටපතක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට අදාළව 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව එම තැනැත්තා ක්‍රියාකර ඇත්නම් මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන එම තැනැත්තා විසින් කඩ කර ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ හේතුව මත මේ පනත යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව වූ යම් නඩු පැවරීමක දී එම තැනැත්තා ජාතික හැඳුනුම්පතක් දරන්නකු බවට කොමසාරිස් ජනරාල් හෝ අතිරේක කොමසාරිස් ජනරාල් හෝ කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු හෝ පොලිස් අධිකාරී ධූරයට වඩා අඩු නොවන නිලයක පොලිස් නිලධරයකු හෝ අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළකරනු ලබන තත්කාර්ය සඳහා දැනුම් දෙනු ලැබූ වෙනත් රජයේ නිලධරයකු සෑහීමට පත්වන බවට එම නිලධරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් එම තැනැත්තා විසින් පටහැනිව ඔප්පු කරනු ලබනතුරු එම තැනැත්තා එම ජාතික හැඳුනුම්පත දරන්නා බවට පූර්ව නිගමනය කළ යුතුය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) එම ජාතික හැඳුනුම්පත නැතිවූ යම් තැනැත්තකු විසින් එම නැතිවීම පිළිබඳව වහාම ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කර ඒ පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කර,

ඉනික්බිතිව, ජාතික හැඳුනුම්පතේ දෙවන පිටපතක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ඉල්ලුම් කළ යුතු ය.''.

(2) එහි (2) වන උපවගන්තියේ -

(අ) (ආ) (i) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඃ-

"(i) ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් නියම කිරීම සඳහා අමාත්‍යවරයාට මෙයින් බලය පවරා ඇති එම දෙවන පිටපත නිකුත් කිරීම සඳහා වූ ගාස්තුව සම්බන්ධයෙන් අත්හැරීමේ සහතිකයක් මේ පනත යටතේ ඉල්ලුම්කරුට නිකුත් කර නැත්නම්, එම ගාස්තුව ගෙවීම පිළිබඳව සාක්ෂියක් ඉදිරිපත් කළ යුතුය; නැතහොත් යම් නියමිත ගෙවීමේ ක්‍රමයක් හරහා එම මුදල් ගෙවන ලද බව තහවුරු කළ යුතු ය; හෝ";

(ආ) එහි (ඇ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඃ-

"(ඇ) ඉල්ලුම්කරු විසින් අතින් අත්සන් කළ යුතුය, නැතහොත් විද්‍යුත් ක්‍රමයෙන් අත්සන් කළ යුතු ය; සහ"

(ඇ) එහි (ඈ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් -

"(ඈ) (i) ඉල්ලුම්කරු විසින් ජාතික හැඳුනුම්පතේ මුල් පිටපත නැතිවීම පිළිබඳව වාර්තා කරනු ලැබූ පොලිස් ස්ථානයේ තොරතුරු පොතේ අදාළ උධෘතයේ සහතික කළ පිටපතක්;

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ගනු ලැබූ නියම කරනු ලබන ජෛවමිතික දත්ත;

(iii) නියම කරනු ලබන නියමිත දිග පළල, පිරිවිතර, ප්‍රමිතිය සහ ගුණාත්මක භාවයෙන් යුත් ඉල්ලුම්කරුගේ ඡායාරූප; සහ

(iv) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් ගනු ලැබූ ඉල්ලුම්කරුගේ ප්‍රතිබිම්බයක්, විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) ජාතික හැඳුනුම්පතක් පළුදු වී ඇති අවස්ථාවක දී හෝ එහි සඳහන් කරුණු මැකී ඇති අවස්ථාවක දී හෝ කියවිය නොහැකි අවස්ථාවක දී හෝ එහි සඳහන් කරුණු කියවිය නොහැකි බවට පත්වීමට ආසන්නවූ අවස්ථාවක දී හෝ ජාතික හැඳුනුම්පතක සඳහන් තොරතුරු වෙනස් වී ඇති අවස්ථාවක දී හෝ හැඳුනුම්පත දරන්නාගේ මතය අනුව ඔහු හෝ ඇය දන්නා පරිදි එම හැඳුනුම්පතේ වැරදි තොරතුරු ඇතුළත්ව ඇති අවස්ථාවක දී හැඳුනුම්පත දරන්නා විසින් වහාම -

(අ) එම කරුණ කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව වාර්තා කළ යුතුය; සහ

(ආ) එම හැඳුනුම්පතේ දෙවන පිටපතක් ලබා ගැනීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුතුය.".

(2) එහි (2) වන උපවගන්තියේ—

(අ) (අඅ) (i) වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඃ-

"(i) එම හැඳුනුම්පතේ දෙවන පිටපතක් ලබාදීම සඳහා වූ ගාස්තුව සම්බන්ධයෙන් අත්හැරීමේ සහතිකයක් මේ පනත යටතේ ඉල්ලුම්කරුට නිකුත් කර නැත්නම් ඒ ගාස්තුව ගෙවීම පිළිබඳව සාක්ෂියක් ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් යම් නියමිත ගෙවීමේ ක්‍රමයක් හරහා එම මුදල් ගෙවන ලද බව තහවුරු කළ යුතු ය; හෝ"

(ආ) (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ආ) ඉල්ලුම්කරු විසින් අතින් හෝ විද්‍යුත් ක්‍රමයකින් අත්සන් කළ යුතු ය; සහ"

(ඇ) (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඃ-

"(ඇ) ඒ සමග -

(i) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු විසින් ගනු ලැබූ නියමිත ජෛවමිතික;

(ii) නියම කරනු ලබන දිග, පළල, පිරිවිතර, ප්‍රමිතිය සහ ගුණාත්මකභාවයෙන් යුත් ඉල්ලුම්කරුගේ ඡායාරූප;

(iii) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවට බලය පවරනු ලැබූ නිලධරයකු හෝ තැනැත්තකු විසින් ගනු ලැබූ ඉල්ලුම්කරුගේ ප්‍රතිබිම්බයක්; සහ

(iv) එම ජාතික හැඳුනුම්පතේ මුල්පිටපත,

ඉදිරිපත් කළ යුතුය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) එසේ නැවත සොයා ගැනීමට පෙර එම තැනැත්තා විසින් 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබුවේ නම්, එම උපවගන්තියේ සඳහන් පොලිස් ස්ථානයට සහ කොමසාරිස් ජනරාල්වරයාට ඒ නැවත සොයාගැනීම පිළිබඳ වහාම දැනුම් දිය යුතු ය; සහ".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) නියමිත දිනයේදී හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවේ පුරවැසියකුවීම අවසන්වන යම් තැනැත්තෙක් එම කරුණ පිළිබඳව වහාම කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර, නියමිත ආකෘති පත්‍රයේ වූ ප්‍රකාශයක් ද සමග එම ජාතික හැඳුනුම්පත කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු භාරදිය යුතුය; නැතහොත් ආපසු භාරදීමට කටයුතු සලස්වනු ලැබිය යුතුය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම වගන්තියේ (1අ) වන උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"(1අ) වෙනත් ජීවත්වන පුද්ගලයකුට අයත් හෝ මිය ගිය තැනැත්තකුට අයත් ජාතික හැඳුනුම්පතක් කිසිම තැනැත්තකු විසින් සිය සන්තකයේ තබා ගැනීම, භාවිත කිරීම හෝ අනිසි ලෙස භාවිත කිරීම නොකළ යුතුය.".

(2) (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(3) මෙහි (1) වන උපවගන්තියේ, (1අ) වන උපවගන්තියේ සහ (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේදී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (2) වන උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) මේ පනත යටතේ විනිශ්චයාධිකාරයක් වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳව එහි තීරණය, දැන්වීමකින් කොමසාරිස් ජනරාල්වරයාට සහ කොමසාරිස් ජනරාල්වරයා හරහා අභියාචක වෙත භාරදීමට විනිශ්චයාධිකාරය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.".

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ගාස්තු අත්හැරීම

36අ. කොමසාරිස් ජනරාල්වරයා හෝ යම් දිස්ත්‍රික් ලේකම්වරයකු හෝ යම් ප්‍රාදේශීය ලේකම්වරයකු විසින්-

(අ) යම් තැනැත්තකුගේ දුගී දුප්පත්භාවය මත එම තැනැත්තා විසින් ලියාපදිංචිය සඳහා හෝ ජාතික හැඳුනුම්පතක දෙවන පිටපතක් නිකුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව අත්හරිනු ලැබිය හැකිය; සහ

(ආ) එම ගාස්තුව අත්හරිනු ලැබුවහොත් එම ගාස්තුව සම්බන්ධයෙන් ගාස්තු අත්හැරීමේ සහතිකයක් එම තැනැත්තාට නිකුත් කරනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (2) වන උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (1) වන උපවගන්තියේ සහ 38 සහ 39 වන වගන්තිවල කාර්ය සඳහා "බලයලත් නිලධරයා" යන යෙදුමෙන් "අතිරේක කොමසාරිස් ජනරාල්වරයා සහ යම් කොමසාරිස්වරයකු, යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු, යම් සහකාර කොමසාරිස්වරයකු, යම් දිස්ත්‍රික් ලේකම්වරයකු හෝ ප්‍රාදේශීය ලේකම්වරයකු අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියට 39අ, 39ආ, 39ඇ, 39ඈ, 39ඉ සහ 39ඊ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ 39ආ, 39ඇ, 39ඈ, 39ඉ සහ 39ඊ වශයෙන් බලාත්මක විය යුතු ය :-

"යම් නියමිත අධිකාරියකින් තොරතුරු ඉල්ලා සිටීමට කොමසාරිස් ජනරාල්වරයාට හෝ බලයලත් නිලධරයකුට ඇති බලතල.

39අ. (1) යම් නියමිත අධිකාරියක් වෙත වාර්තාගත කර ඇති යම් තැනැත්තකුට අදාළ නියමිත තොරතුරු, ලිඛිතව ඉදිරිපත් කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ බලයලත් නිලධරයකු විසින් මේ පනත යටතේ සිය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා එම අධිකාරියට නියම කරනු ලැබිය හැකි ය.

(2) එම නියමයට අනුව ක්‍රියාකිරීම (1) වන උපවගන්තියේ සඳහන් අධිකාරිය භාරව සිටින තැනැත්තාගේ කාර්යභාරය වන්නේ ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සම්ප්‍රේෂණය කරන ලද තොරතුරු මේ පනතේ කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය.".

කොමසාරිස් ජනරාල්වරයා හෝ යම් නියමිත නිලධරයකු විසින් ඉල්ලා සිටීමේදී සහතික පිටපත් නිකුත් කළ යුතු බව සහ තොරතුරු ඉදිරිපත් කළ යුතු බව.

39ආ. කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ නියමිත නිලධරයකු විසින් නියමිත ආකාරයකට -

(අ) යම් තැනැත්තකු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත සහ නියමිත ගාස්තුව ගෙවීමේ දී එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ සහතික පිටපතක් එම තැනැත්තාට නිකුත් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) යම් රජයේ නිලධරයකු විසින් තම නිල කාර්ය ඉටු කිරීමේ දී ඔහු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත මේ පනතේ 39ඇ වගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකුගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් විස්තරවල සත්‍යතාව පිළිබඳව සහතික කරනු ලැබිය හැකි ය; හෝ

(ඇ) යම් නියමිත අධිකාරියක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත සහිතව එම හැඳුනුම්පත දරන්නා පිළිබඳ විස්තරවල සත්‍යතාව සහතික කරනු ලැබිය හැකි ය.

ජාතික ආරක්ෂාව අපරාධ වැළැක්වීම ආදිය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු සැපයීම.

39ඈ. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුවද, -

(අ) ජාතික ආරක්ෂාව පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද විධානයක් මත ජාතික ආරක්ෂාවේ යහපත උදෙසා; හෝ

(ආ) අපරාධ වැළැක්වීම හෝ අපරාධ අනාවරණය කර ගැනීම සඳහා ; හෝ

(ඇ) නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන යම් ආඥාවකට අනුව ක්‍රියාකිරීමේ කාර්ය සඳහා,

ලියාපදිංචි තැනැත්තකුට අදාළව පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ වාර්තාගත කර ඇති යම් තොරතුරක්, රාජ්‍ය නිලධරයකුට හෝ අධිකාරියකට හෙළිදරව් කිරීම අවශ්‍යවන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් එවැනි යම් තොරතුරක් සැපයීම නීත්‍යනුකූල වන්නේය.

නිදහස් කිරීම්.

39ඈ. අමාත්‍යවරයා විසින් ජාතික ආරක්ෂාවේ යහපත උදෙසා, මේ පනතේ විධිවිධානවලින් යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් අදාළවීමෙන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පන්තියක් යම් නියම හා කොන්දේසිවලට යටත්ව අවශ්‍ය ප්‍රමාණයට නිදහස් කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයාට නියම කරනු ලැබිය හැකි ය.

පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයට අනවසර ලෙස ප්‍රවේශය.

39ඉ. (1) කිසිම තැනැත්තකු විසින් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය නොමැතිව පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයට ප්‍රවේශවීම හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ අන්තර්ගත ලියාපදිංචි තැනැත්තකුට අදළව යම් තොරතුරක පිටපත් හෝ උධෘත ලබාගැනීම නොකළ යුතු ය.

(2) කිසිම තැනැත්තකු විසින් මේ පනත යටතේ තම කාර්යභාරය ඉටුකිරීමේ දී ඔහුට දැනගැනීමට ලැබෙන පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ වාර්තාකර ඇති යම් තොරතුරක් අයුතු ලෙස වෙනස් කිරීම නොකළ යුතු ය.

නිල රහස්‍යභාවය.

39ඊ. මේ පනතේ අධිකාරි බලය යටතේ පත් කරන ලද සෑම තැනැත්තෙක්ම තම කාර්යභාරයට ඇතුළත්වීමට පෙර මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කාර්ය සහ කර්තව්‍ය කිරීමේදී සහ ඉටුකිරීමේ දී තමාට දැන ගැනීමට ලැබුණ යම් තොරතුරක් පිළිබඳව එම තැනැත්තා විසින් තදින්ම රහස්‍යභාවය රකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තම බලතල ඉටුකිරීමේදී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා හැර, එවැනි යම් තොරතුරක් හෙළිදරව් නොකරන බවට එම ප්‍රකාශය මඟින් පොරොන්දු විය යුතු ය.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ "කොමසාරිස්වරයා", "නියෝජ්‍ය කොමසාරිස්වරයා", "සහකාර කොමසාරිස්වරයකු" යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා, අතිරේක කොමසාරිස් ජනරාල්වරයා සහ කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු සහ සහකාර කොමසාරිස්වරයකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"කොමසාරිස් ජනරාල් ආදී තනතුරු දරන අය සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

43. කොමසාරිස් ජනරාල්වරයා, අතිරේක කොමසාරිස් ජනරාල්වරයා, සෑම දිස්ත්‍රික් ලේකම්වරයකු, සෑම කොමසාරිස්වරයකු, සෑම ප්‍රාදේශීය ලේකම්වරයකු, සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු, සෑම සහකාර කොමසාරිස්වරයකු, සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු, සෑම සහතික කිරීමේ නිලධරයකු සහ

කොමසාරිස් ජනරාල්වරයාගේ අධිකාරි බලය යටතේ ක්‍රියා කරන සෑම නිලධරයකුම සාම නිලධරයකුට පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

“වැරදි 44. (1) (අ) 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම පැහැර හරින;

(ආ) එම ඉල්ලුම් පත්‍රයේ හෝ යම් විමසීමකට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් අසත්‍ය තොරතුරු සපයන;

(ඇ) එවැනි ඉල්ලුම් පත්‍ර එකකට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරන;

(ඈ) වංචාවක් සිදුකිරීම මගින් ජාතික හැඳුනුම්පතක් ලබාගන්නා; හෝ

(ඉ) 24 සහ 47 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුවද, ජාතික හැඳුනුම්පත් එකකට වැඩි ප්‍රමාණයක් වංචනිකව ලබා ගන්නා හෝ තම සන්තකයේ තබාගන්නා හෝ භාවිත කරන,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් ජාතික හැඳුනුම්පතක් ලබාගැනීමට එක් තැනැත්තකු හෝ වැඩි තැනැත්තන් ප්‍රමාණයක් සංවිධානය කරන හෝ ඔවුන්ට පහසුකම් සළසන

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේදී රුපියල් එක්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත්විය යුතු ය.

(3) (අ) 38 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති, තමාගේ සේවයෙහි නියුක්ත යම් තැනැත්තකු හෝ තැනැත්තන් සම්බන්ධයෙන් වාර්තාවක් සපයන ලෙස එම වගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ යම් නියමයක් අනුව ක්‍රියා කිරීමේ කාර්ය ඉටුකිරීම පැහැර හරින; හෝ

(ආ) ඒ තැනැත්තා හෝ තැනැත්තන් පිළිබඳ අසත්‍ය වූ හෝ වැරදි වූ යම් තොරතුරක් අඩංගු එවැනි යම් වාර්තාවක් සපයන,

සේවායෝජකයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර -

(i) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් පරිදි වාර්තාවක් සැපයීම පැහැර හැරීමට තොරතුරු සැපයීම ඔහු විසින් අත්හැරීමට අදාළවන එක් එක් තැනැත්තා හෝ තැනැත්තන් සම්බන්ධයෙන්; සහ

(ii) මේ උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් පරිදි අසත්‍ය හා වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට අදාළවන එක් එක් තැනැත්තා හෝ තැනැත්තන් සම්බන්ධයෙන්,

එසේ වරදකරු කරනු ලැබීමේදී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු වරදකරු විය යුතු ය.

(4) (1) සිට (3) දක්වා වූ උපවගන්තිවල සඳහන් යම් විධිවිධානයක් හැර, මේ පනතේ යම් විධිවිධානයකට හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයකට අනුකූලව ක්‍රියාකිරීම උල්ලංඝනය කරන හෝ පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේදී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

(5) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද -

(අ) (2) වන උපවගන්තිය යටතේ සංවිධානය කිරීමට පහසුකම් සැලැස්වීමට උත්සාහ කරන හෝ වෙනත් යම් තැනැත්තකුට ආධාර හෝ අනුබල දෙන; හෝ

(ආ) ලියාපදිංචිවීමට යටත් යම් තැනැත්තකුට මේ පනත මගින් නියම කර ඇති පරිදි ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් නොකිරීමට ආධාර සහ අනුබල දෙන නැතහොත් එවැනි තැනැත්තකු පොළඹවන; හෝ

(ඇ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන නැතහොත් පහසුකම් සලස්වන,

යම් රජයේ නිලධරයෙක් ඇතුළු යම් තැනැත්තෙක් වරදක් සිදු කරනු ලබන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකින් හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් මගින් ඔහු එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (2)වන සහ (3)වන උපවගන්ති ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(ඊඊ) විද්‍යුත් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා ඉල්ලුම් කිරීම සහ ඉල්ලුම්කරුවකු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය;

(ඊඊඊ) ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමෙන් පසු ඉල්ලුම් පත්‍ර විනාශ කිරීමේ ක්‍රියාවලිය;

(ඊඊඊඊ) 39 ආ වගන්තියේ කාර්ය සඳහා ගාස්තු තීරණය කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "දිසාපති" යන යෙදුමේ අර්ථ නිරූපණය අත්හැරීමෙන්;

(2) "උචිත විනිශ්චයාධිකාරය" යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත සඳහන් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් :-

'"අතිරේක කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා අතිරේක කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් හෝ එම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන නිලධරයකු අදහස් වේ;';

(3) "සහකාර කොමසාරිස්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් :-

'"ජෛවමිතික දත්ත" යන්නට, යම් තැනැත්තකුගේ ඇඟිලි සලකුණු ඇතුළත් වේ;';

(4) "කොමසාරිස්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන් :-

'"කොමසාරිස්වරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා කොමසාරිස්වරයකු වශයෙන් හෝ එම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් හෝ එම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන නිලධරයෙක් අදහස් වේ;';

(5) "දිස්ත්‍රික්කය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

'"දිස්ත්‍රික් ලේකම්" යන්නෙන්, 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්) පනතේ සඳහන් දිස්ත්‍රික් ලේකම්වරයා අදහස් වේ;

"ප්‍රාදේශීය ලේකම්" යන්නට, 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්) පනත යටතේ ඊට ලබාදී ඇති අර්ථයම තිබිය යුතු ය;';

(6) "ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කිරීම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

'"ලියවිල්ලක්" යන්නෙන්, අතින් හෝ විද්‍යුත් මාර්ගයෙන් ලියන ලද ලියවිල්ලක් ද ඇතුළත් වේ.'.

**32.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ වලංගු හැඳුනුම්පතක සන්තකය දරන සෑම තැනැත්තෙක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ යම් කාලසීමාවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත නැවත ලියාපදිංචි විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලද හැඳුනුම්පත් දරන්නන් ලියාපදිංචි කිරීමට අදාළ විශේෂ විධිවිධාන.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සෑම හැඳුනුම්පතක්ම එම නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත්වීමේ දිනයේදී වලංගුවීම අවසන් විය යුතු ය.

(3) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලය තුළ නැවත ලියාපදිංචිවීමට අපොහොසත් වූ තැනැත්තකු නැවත ලියාපදිංචි වීම වළක්වනු ලබන බවට තේරුම් නොගත යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කාල සීමාව අවසන්වන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය.

**33.** (1) මේ පනත ආරම්භවීමේ දිනයට පෙර දිනයේ අවුරුදු පහළොව සම්පූර්ණ කළ එහෙත් අවුරුදු දහසය සම්පූර්ණ නොකළ සහ එම නිසා ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිවීමට යටත් නොවූ ද සහ මේ පනත මගින් සංශෝධිත එම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඒ දිනයේ දී එසේ ලියාපදිංචිවීමට යටත්වන සෑම පුරවැසියකුම එම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචිවීම සඳහා නියමිත කාලසීමාව තුළ එම තැනැත්තා විසින් ඉල්ලීමක් කරන්නේ නම් ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය යටතේ වූ වරදකට එම තැනැත්තා වරදකරුවකු ලෙස සළකනු නොලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් වරදකරුවන් ලෙස සලකනු නොලැබිය යුතු බවට වන විශේෂ විධිවිධාන.

(2) මේ වගන්තියේ "නියමිත කාලය" යන්නෙන්, (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුට ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (4) වන උපවගන්තිය සමග කියවිය යුතු 52 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් ප්‍රකාරව එම ප්‍රඥප්තියේ විධිවිධාන

යටතේ ලියාපදිංචිවීමට ඉල්ලුම් කිරීම සඳහා නියම කර ඇති කාලසීමාව අදහස් වේ.

යටිතල පහසුකම් වැඩ පිළිවෙල ආදියට අදාළ විශේෂ විධිවිධාන.

**34.** (1) මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6, 9, 14, 16 සහ 17 වන වගන්තිවලට කරන ලද සංශෝධන නොතකා, ප්‍රධාන ප්‍රඥප්තියේ 6, 9, 14, 16 සහ 17 වන වගන්තිවලට කරන ලද සංශෝධන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩ පිළිවෙල සහ තාක්ෂණික ක්‍රමවේද සකස් කරන තුරු මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව බලාත්මකව පැවති ප්‍රධාන ප්‍රඥප්තියේ 6, 9, 14, 16 සහ 17 වන වගන්ති සහ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම මේ පනත යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රධාන ප්‍රඥප්තියේ 6, 9, 14, 16 සහ 17 වන වගන්ති ක්‍රියාත්මක වීමේ කාලසීමාව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලබන ප්‍රධාන ප්‍රඥප්තියේ 6, 9, 14, 16 සහ 17 වන වගන්ති ක්‍රියාත්මක වීමේ කාලසීමාව අවසන් වන දිනය අමාත්‍යවරයා විසින් සමාන නියමයක් මගින් කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**35.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.